# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 පෙබරවාරි මස 15 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 පෙබරවාරි මස 17 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 පෙබරවාරි මස 15 වැනි දින]

එල්.ඩී.—ඕ. 37/2011.

**2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2011 අංක 23 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, "ගාස්තු හෝ අය කිරීම්" යන වචන වෙනුවට "ගාස්තු, අයකිරීම්, පැනවීම් හෝ දණ්ඩන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) "මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා" යන වචනවල සිට "කොමිෂන් සභාව සමන්විත විය යුතු ය." දක්වා ඇති වචන ඉවත්කොට ඒ වෙනුවට, "කොමිෂන් සභාව, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් අතුරින් එක් අයෙකුගෙන් ද, බදුකරණය, මූල්‍ය සහ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් දැනුමක් සහිත සහ විශිෂ්ඨත්වයක් ලත් තැනැත්තන් අතුරින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙකුගෙන් ද සැදුම්ලත් සාමාජිකයන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"(4) (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක්

2—PL 006436 - 3,350 (2011/12)

නිසා මේ පනත යටතේ වූ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන යම් සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "අමාත්‍යවරයා විසින් මූල මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක්" යන වචන වෙනුවට "කොමිෂන් සභාව විසින්, මූල මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනකුට නොඅඩු සංඛ්‍යාවක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) "දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා" යන වචන වෙනුවට "(මේ පනතේ මින්මතු "කොමසාරිස්-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව පත් කරනු ලබන දේශීය ආදායම් - කොමසාරිස් ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ගාස්තුවක් හෝ අය කිරීමක්" යන වචන සහ "උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන වෙනුවට පිළිවෙළින් "ගාස්තුවක්, අය කිරීමක්, පැනවීමක් හෝ දණ්ඩනයක්" යන වචන සහ "අනුපිළිවෙලින් I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම උපවගන්තියේ අතුරු විධානයේ "එකී ප්‍රඥප්තිය යටතේ එම තැනැත්තා විසින් ගෙවිය යුතු" යන වචන වෙනුවට "එකී ප්‍රඥප්තිය යටතේ බද්දක්, ගාස්තුවක්, අය කිරීමක්, පැනවීමක් හෝ දණ්ඩනයක් වශයෙන් එම තැනැත්තා විසින් ගෙවිය යුතු" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, "මේ පනතේ උපලේඛනයේ" යන වචන වෙනුවට "මේ පනතේ I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

(4) එම වගන්තියේ පැති සටහන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"I වන සහ II වන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ ලබා දෙන ලද නිශ්චය කිරීමකට එරෙහිව කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතිය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය.

8. (1) යම් බදු, ගාස්තු, අය කිරීම්, පැනවීම් හෝ දණ්ඩන පිළිබඳව වූ යම් කාරණයක් සම්බන්ධයෙන් කොමසාරිස්-ජනරාල්වරයාගේ නිශ්චය කිරීමක් මගින් පීඩාවට පත්වන යම් තැනැත්තකු විසින්, තමා කොමසාරිස්-ජනරාල්වරයා විසින් ප්‍රකාශ කරන ලද හේතු සමග අතෘප්තියට පත්ව ඇත්නම්, එවිට, එම නිශ්චය කිරීමේ දින සිට දින තිහක් ඇතුළත ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. කොමිෂන් සභාව විසින්, කලින් කල, තත්කාර්ය සඳහා සාදනු ලැබිය හැකි රීතිවලට අනුකූලව එකී අභියාචනා විභාග කර නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීමේ ආකාරය සහ ආකෘතිය මෙන්ම ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ඇත්නම් එම ගාස්තු කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, "උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන වෙනුවට "I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ, "උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන වෙනුවට "I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "තීරණය" සහ "තීරණයක්" යන වචන යෙදී ඇති සෑම ස්ථානයක් සඳහා ම පිළිවෙලින් "නිශ්චය කිරීම" සහ "නිශ්චය කිරීමක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "දින එකසිය අසූවක් ඇතුළත" යන වචන වෙනුවට "දින දෙසිය හැත්තෑවක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ අතුරු විධානයේ "එසේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ දින සිට දින එකසිය අසූවක් ඇතුළත" යන වචන වෙනුවට "කොමිෂන් සභාව සිය රැස්වීම් ආරම්භ කරනු ලබන දින සිට මාස දොළහක කාලයක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 12අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

"රීති.

12අ. (1) මේ පනත යටතේ රීති සෑදිය යුතු බවට නියම කර ඇත්තේ සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් ද, එම කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලබන සියලු රීති අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඉන් පසුව ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, එහි "උපලේඛනයේ" යන වචනය නිරූපනය වන සෑම ස්ථානයකම ඒ වෙනුවට "I වන උපලේඛනයේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 13අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 13අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ඇතැම් පනත්වල විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති වෙනස් බදු අය කළ හැකි කාලසීමා සඳහා අදාළ වන්නා වූ එම පනත් යටතේ සමාලෝචන මණ්ඩලය ඉදිරියේ පවත්නා අභියාචන.

13අ. මේ පනත ආරම්භ වන දිනය වන විට, මේ පනතේ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්තිවල විධිවිධාන ප්‍රකාරව අදාළ සමාලෝචන මණ්ඩලය හෝ මණ්ඩල ඉදිරියේ පවත්නා යම් අභියාචනයක් ඉහත සඳහන් කළ ප්‍රඥප්තිවල එම විධිවිධාන එහි නිශ්චිතව දක්වා ඇති පරිදි වෙනස් බදු අය කළ හැකි කාලසීමා සඳහා අදාළ වේ යන කරුණ නොතකා, කොමිෂන් සභාව වෙත පවරා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) උපලේඛනය "I වන උපලේඛනය" ලෙස නැවත අංකනය කිරීම මගින් ;

(2) නැවත අංකනය කරන ලද I වන උපලේඛනයේ 3 වන අයිතමයේ II වන තීරය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 166, 167, 168, 169 සහ 170 යන වගන්ති සමග කියවිය යුතු, ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 8 වන වගන්තිය.";

(3) නැවත අංකනය කරන ලද I වන උපලේඛනයේ 3 වන අයිතමයේ III වන තීරය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 8 වන වගන්තිය, එහි "අභියාචනා සම්බන්ධයෙන් අදාළ XXII පරිච්ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 166, 167, 168, සහ 169 වගන්ති හැර) අභියාචනාවලට අදාළ XXII පරිච්ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) නැවත අංකනය කරන ලද I වන උපලේඛනයේ 4 වන අයිතමයේ II වන තීරය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 166, 167, 168, 169 සහ 170 යන වගන්ති සමග කියවිය යුතු, ආර්ථික සේවා ගාස්තු පනතේ 11 වන වගන්තිය";

(5) නැවත අංකනය කරන ලද I වන උපලේඛනයේ 4 වන අයිතමයේ III වන තීරය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"ආර්ථික සේවා ගාස්තු පනතේ 11 වන වගන්තියේ "පිළිවෙළින් අභියාචන" යන වචන වෙනුවට "(2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 166, 167, 168 සහ 169 වන වගන්ති හැර) පිළිවෙලින් අභියාචන සඳහා අදාළ වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(6) එහි 4 වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :—

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත. | 11 වන වගන්තිය | මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තිය එහි "තක්සේරු කිරීම, අභියාචන, අභියාචනා පිළිබඳව තීරණය කිරීම සම්බන්ධයෙන් වූ දේශීය ආදායම් පනතේ XVIII පරිච්ඡේදයේ සිට XXIV පරිච්ඡේදය දක්වා වූ පරිච්ඡේද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සමාලෝචන මණ්ඩලයේ අභියාචනාවලට අදාළ තක්සේරු කිරීම, අභියාචන, අභියාචන නිශ්චය කිරීම සම්බන්ධයෙන් (2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 166, 167, 168 සහ 169 යන වගන්ති හැර) දේශීය ආදායම් පනතේ XVIII පරිච්ඡේදයේ සිට XXIV පරිච්ඡේදය දක්වා වූ පරිච්ඡේද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; |

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කරනු ලබන අතර, එය, එහි II වන උපලේඛනය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය ඇතුළත් කිරීම.

"II වන උපලේඛනය.

ප්‍රඥප්තියේ නම

1. 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත.

2. 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත".

**13.** මේ පනතේ 10 වන වගන්තියේ විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධන, සියලු කාර්ය සඳහා 2011 මාර්තු මස 31 වන දින සිට බලාත්මකව පැවති බවට සලකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.